11 අනාථ පිණ්ඩික සිටුතුමා

අන්තර් පළාත් සාහිත්‍ය දින තරගාවලියේදී ප්‍රාථමික අංශයේ රචනා තරගය නියෝජනය කරමින් ප්‍රථම ස්ථානය දිනාගත් ශිෂ්‍යයෙකු ''අනේ පිඬු සිටුතුමා'' මැයින් තරගයට ලියා ඉදිරිපත් කළ රචනාවක් පහත දැක්වේ.

''ඉදං හි තං ජේතවනං
ඉසි සංඝං නිසෙවිතං
ආවුත්තං ධම්ම රාජෙන
පීති සංජනනං මම............''

'' බුදුරජාණන් වහන්සේ වැඩ වෙසෙන, භික්ෂු සංඝයා නිතර ගැවසෙන මේ ජේතවන විහාරය මට නිතර ප්‍රීතිය දනවයි................''



මේ එක්තරා දිව්‍ය පුත්‍රයෙකු නිතර නිතර ජේතවනාරාමය පැදකුණු කරමින් ගයන ලද ගීයකි. ඒ දිව්‍ය පුත්‍රයා'' අන් කවරෙකුවත් නොව ''අනේ පිඬු සිටුතුමා'' නමින් බුදු සසුනේ දායකයන් අතර අගතැන්පත් ''සුදත්ත'' සිටුතුමා යි.

සැවැත් නුවර විසූ ''සුදත්ත'' සිටුතුමා, අනාථ අසරණ දුගී ජනතාවට මහත් කරුණාවෙන් ආහාරපානාදියෙන් සංග්‍රහ කිරීමට පුරුදු වී සිටියේ ය. එනිසා ම ඔහු ''අනාථ පිණ්ඩික'' යන විරුද නාමයෙන් ද හඳුන්වන ලදි.

රජගහනුවර සිටුතුමා සුදත්ත සිටුතුමාගේ හිතවතෙක් විය. දිනක් ඔහු හමුවීමට එහි ගිය අවස්ථාවේදී රජගහනුවර සිටුතුමාට සුදත්ත සිටුතුමා සමඟ කතා කිරීමට තරම් වත් විවේකයක් නොවී ය. මේ කාර්යය බහුලත්වය කුමක්ද'යි විපරම් කළ සුදත්ත සිටුතුමාට දැනගන්නට ලැබුණේ, පසු දින බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ රජගහ නුවර සිටුතුමාගේ මැදුරට දානයට වඩින බවයි. 'බුද්ධ' යන නම ඇසුණු පමණින් ම ප්‍රීතියෙන් පිනා ගිය සුදත්ත සිටුතුමා බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමේ ආශාවෙන් රැය පහන් කළේ මහත් නොඉවසිල්ලෙනි. අලුයම් වේලෙහි සීත වනයට පිවිසි සිටුවරයාට එහි සක්මන් කරමින් සිටි බුදුරජාණන් වහන්සේ මුණ ගැසිණි.

අනේපිඬු සිටුවරයාව ඈතදී ම දුටු බුදුරජාණන් වහන්සේ 'සුදත්ත මෙහි එන්න' යැයි පැවසූහ. සිය නමින් ම ඇමතීම ගැන ප්‍රීතියෙන් ඉපිල ගිය සිටුතුමා සමඟ බුදුරජාණන් වහන්සේ කෙටි පිළිසඳරක යෙදුණ හ. එයින් ම සුදත්ත සිටුතුමා සෝවාන් විය. රජගහනුවර සිටුතුමාගේ නිවසේදී ම බුදු පාමොක් මහ සඟනට දන් පිළිගැන්වූ සුදත්ත සිටුතුමා ඉදිරි වස් තුන් මස සැවැත් නුවර වස් වසන ලෙස ආරාධනා කළේ ය. බුදුරජාණන් වහන්සේ එම ආරාධනාව ඉවසා වදාළහ.

සැවැත් නුවරට පැමිණි අනේපිඬු සිටුතුමා පළමුවෙන් ම කහවණු දහඅට කෝටියක් බිම අතුරා ජේත නම් කුමාරයාගේ උයන මිල දී ගත්තේ ය. එහි විහාර, උපස්ථාන ශාලා, සක්මන් මලු, ආදි ආරාමික අංග සපුරාලීමට තවත් කහවණු දහඅට කෝටියක් වැය කළේ ය. 'ජේතවනාරාමය' යනුවෙන් අප හඳුන්වන්නේ මේ ආරාමය යි. 'ජේතවනාරාමය' බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජා කිරීම සඳහා අනේපිඬු සිටුතුමා තවත් කහවණු දහ අට කෝටියක් වැය කළේ ය.

අනේපිඬු මහ සිටුතුමා දවසට තෙවරක් දෙවුරම් වෙහෙරට යයි. එතුමා දකින කුඩා සාමණේරයන් වහන්සේලා ගෙනාවේ මොනවාද'යි සිටුතුමාගේ දෑත් දෙස බලති. එනිසා එතුමා කිසිවිටෙක හිස් අතින් නොයයි. උදේ යන විට කැඳ අවුළුපත් ද, දවල් දානයෙන් පසුව යනවිට ගිතෙල්, වෙඬරු, සකුරු ආදී චතුමධුර ද රැගෙන යයි. සවසට යන්නේ තෙල්, මල්, පහන්, සුවඳ ආදිය රැගෙන ය.

සිටුතුමා තුළ බුදුරදුන් පිළිබඳව පැවතුණේ එතෙක් මෙතෙක් කිසිදු උපාසකයකු තුළ නොතිබූ තරම් ගෞරවයකි. ආදරයකි. උන්වහන්සේ වෙහෙස වේ යැයි සිතා කිසිදිනක ධර්ම කාරණාවක්වත් ඇසුවේ නැත. එනිසා ''අනාථ පිණ්ඩික මා නොරැකිය යුතු තැන රකී'' යයි බුදුරජාණන් වහන්සේ ම වදාළ සේක. එසේ වුවත් උන්වහන්සේ සිය කැමැත්තෙන් ම එතුමාට ධර්ම දේශනා කරන සිරිතක් තිබුණි.

අනේපිඬු සිටුතුමාගේ නිවසේ දිනපතා පන්සිය නමකට දානය සූදානම් ව තිබුණි. එහෙත් ඒ දන් පිළිගැන්වීමට එතුමාට නිවසේ රැඳීමට ලැබෙන්නේ කලාතුරකිනි. සැවැත් නුවර කොතැනක හෝ දානමය පින්කමක් පැවැත්වේනම්, එය හරිහැටි කෙරෙන්නට නම් එතුමා හෝ විශාඛා උපාසිකාව එහි මුල්තැන ගත යුතුයැයි නුවර වැසියන්ගේ පිළිගැනීමක් තිබූ නිසා ය.

එතුමන් නැති දිනවල නිවසේ දන් පිළිගැන්වීම කළේ එතුමාගේ දූ දරුවන් ය. මහ සිටුතුමා ට, මහා සුභද්‍රා, චූල සුභද්‍රා, සුමනා යයි දූවරුන් තිදෙනෙක් ද කාල නම් පුතෙක් ද වූහ. වැඩි මහලු දියණියන් දෙදෙනා සෝවාන් වී පතිකුලයට ගොස් පින් දහම් කරමින් විසූහ. බාල දියණිය සුමනා පතිකුලයට නොගොස් ගෙදර ම රැඳුණා ය. ඇය පියාගේ පින්කම් වලට සහාය වෙමින් සිට සකෘදාගාමී වී රෝගයකින් මිය ගියා ය. සිටුතුමා විනෝදයට බර වූ සිය පුතු නිවන් මගට ගත්තේ උපක්‍රමයකිනි. පියාගෙන් මුදල් ලබාගන්නට බණ පදයක් මතක තබාගෙන එන්නට ගිය කාල සිටුපුත් එම බණ ම අසා සෝවාන් විය.

පන්සතළිස් වසරක බුද්ධ ජීවිතයේ වසර විසිපහක් ම ගත වූයේ සැවැත් නුවර ය. එයින් දහනව වසරක් ම විසුවේ ජේතවනාරාමයේ ය. ඉතිරි සය වසර පූර්වාරාමයේ ය. උන්වහන්සේ ජේතවනාරාමයෙන් බැහැර වූ අවස්ථාවලදී වන්දනාමාන කිරීම සඳහා සුදුසු වස්තුවක් හා ස්ථානයක් අවශ්‍ය වූ බැවින් බුදුරජාණන් වහන්සේගේ අනුශාසනා පරිදි, ආනන්ද හාමුදුරුවන් වහන්සේගේ මූලිකත්වයෙන් හා කොසොල් රජතුමාගේ සහාය ද ඇතිව ශ්‍රී මහා බෝධි ශාඛාවක් ජේතවනාරාමයෙහි රෝපණය කරනු ලැබී ය. ඒ සඳහා අනේ පිඬු සිටුතුමාගේ පූර්ණ දයකත්වය ලැබිණි. එය ''ආනන්ද බෝධිය'' නමින් හැඳින්විණි.

පින් දහමින් ම දිවි ගෙවූ අනේපිඬු සිටුතුමාගේ ධනය කලකදී පිරිහිණි. එතුමාට ආපසු නොලැබුණු ණය පමණක් කහවණු දහ අට කෝටියක් විය. තවත් දහ අට කෝටියක රන් ගං ඉවුරක නිදන් කර තිබී මුහුදට ගසාගෙන ගියේ ය.

සිටු මැඳුරේ දොරටුවට අරක්ගෙන සිටි දෙවියා දන්දීම ප්‍රිය නොකළේ ය. ඔහු ධනයෙන් පිරිහී සිටි සිටුතුමාට දන්දීම නවත්වා ව්‍යාපාර දියුණු කරන්නැයි උපදෙස් දුන්නේ ය. ඒ ඇසූ සිටුතුමා ''ඔබ වගේ කෙනෙකුගේ ආරක්‍ෂාව මට වුවමනා නැත. වහාම පිටවෙන්නැ'' යි කියා දෙවියා පලවා හැරියේ ය. විමානය අහිමි වූ දෙවියාට තම දුක් ගැනවිල්ල කියන්නට සක්දෙව් රජ ළඟට ම යන්නට සිදුවිය. එහෙත් මහ සිටුතුමාට කරුණු කියන්නට සක් දෙවිඳුවත් එඩිතර වූයේ නැත. අන්තිමට සක් දෙව්රජු දෙවියාට දඬුවම් වශයෙන් ණයකරුවන් සිටුතුමාට ණය ගෙවන්නට පොළඹවන්නටත්, මුහුදට ගිය රන් නැවත ගබඩා වලට යවා සිටුතුමාගෙන් සමාව ගන්නටත් නියම කළේ ය. දෙවියාට විමානය ලැබුණේ ඉන් පසුව ය. එයින් යළිත් එතුමාගේ ආර්ථිකය යහපත් විය. පින් දහම් ද සුපුරුදු ලෙස ම කරගෙන ගියේ ය.

සිටුතුමාගේ ජීවිතයේ අවසන් මොහොතේ දී, සැරියුත් තෙරණුවෝ වැඩමවා, 'අනාථ පිණ්ඩිකෝවාද සූත්‍රය' දේශනා කළහ. ඒ අසා සිටුතුමා මෙබඳු දහමක් මුළු ජීවිතයට ම අසන්නට නොලැබුණේ යැයි ඒ දේශනාවට ප්‍රශංසා කළේ ය. ඒ සතුටින් ම මිය පරලොව ගිය අනේපිඬු සිටුතුමා තුසිත දෙව්ලොව උපන්නේ ය. මුලින් සඳහන් වන්නේ එතුමා එදා ම රෑ දෙවුරම් වෙහෙර වටා යමින් ගැයූ ගීයයි.

ක්‍රියාකාරකම 11.1

1. අනේපිඬු සිටුතුමා පිළිබඳව පොත පතින් තවත් තොරතුරු රැස් කර අභ්‍යාස පොතේ සටහන් කරන්න.
2. පාඩමේ ඔබ සිත් ගත් තැනක් චිත්‍රයට නගන්න.
3. අනේපිඬු සිටුතුමා පිළිබඳ ව වාක්‍ය දහයක් ලියන්න.

ක්‍රියාකාරකම 11.2

හිස්තැනට සුදුසු වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

1. අනේපිඬු සිටුතුමා නමින් ප්‍රසිද්ධියට පත් වූයේ (සුදත්ත/ රජගහනුවර) සිටුතුමා ය.
2. ජේතවනාරාමය ඉදි කිරීම සඳහා භූමිය මිලට ගත්තේ (කොසොල් රජුගෙනි/ ජේත කුමරුගෙනි)
3. ජේතවනාරාමය ඉදි කොට සඟසතු කොට පූජා කිරීම සඳහා වැය වූ මුදල කහවණු (18 කෝටියකි/ 54 කෝටියකි.)
4. අනේපිඬු සිටුතුමා දවසට (තෙවරක්/ දෙවරක්) බුදුරදුන් බැහැ දැකීමට ගියේ ය.
5. ජේතවනාරාමයේ රෝපණය කොට ඇති බෝධිය (ශ්‍රී මහා බෝධිය යි/ ආනන්ද බෝධිය යි).

ජීවිතයට ඔවදනක්

"කල්‍යාණි මෙව මුඤ්චෙය්‍ය
නහි මුඤ්චෙය්‍ය පාපකං"

යහපත් වචන ම මුවෙන් පිට කරන්න.
අයහපත් වචන පිට නොකරන්න.